**සජිත් ප්‍රේමදාස, (පා.ම.)**
විපක්ෂ නායක - ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
**சஜித் பிரேமதாச, (பா.உ.)**
எதிர்க்கட்சித் தலைவர் - இலங்கைப் பாராளுமன்றம்
**Sajith Premadasa, (M.P.)**
Leader of the Opposition - Parlimaent of Sri Lanka

2023.05.01

**විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මහතා විසින් නිකුත් කරන ලද මැයි දින පණිවිඩය!**

ලොව පුරා සිටින වැඩ කරන ජනතාව සෑම වසරකම මැයි 1 වන දා ඔවුන්ගේ සම්ප්‍රදායන්, ඉතිහාසයන් හා ජයග්‍රහණයන් සමරති. 1886දී පැය අටක වැඩ දිනයක් ඉල්ලා චිකාගෝ නුවර කම්කරුවන් ජීවිත පූජා කරමින් සිදුකළ ඓතිහාසික අරගලය සිහිපත් කරමින් ජාත්‍යන්තර කම්කරු දිනය සමරන අතර ශ්‍රී ලාංකේය වැඩකරන ජනතාව ද එම ඓතිහාසික දිනය සිහිපත් කරනු ලබයි. රටක් ලෙස බලවත් අර්බුදයන් රැසකට මුහුණ දී සිටින තත්වයක් තුළ අපේ රටේ වැඩකරන ජනතාවට ද ද ලෝක කම්කරු දිනය සමරන්නට සිදුව ඇති අතර එය වසර කිහිපයක් තිස්සේ පැමිණි අදූරදර්ශී පාලනයක් විසින් ඇතිකළ හිතුවක්කාරී අන්තනෝමතික බවේ ප්‍රතිඵලයකි.

රට පත්ව ඇති බරපතල ආර්ථික අර්බුදය ජාතික සම්පත් විකුණා දමමින් යටපත් කිරීමට බොළඳ අසාර්ථක සහ පැලැස්තර විසඳුමක යෙදීමට වර්තමාන ආණ්ඩුව කටයුතු කරමින් සිටින අතර එයින් ඇති වන්නේ දේශීය සම්පත් සියල්ල රටට අහිමි වූ කාන්තාර බිමක් පමණි. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා බලයට පත්වීමත් සමග අපේ රට ඉතිහාසගත පරිහානියකට ලක්වූ අතර වර්තමාන පාලනය තුළින් එකී අසාර්ථක ගමන ඉතා සාර්ථකව ඉදිරියට යමින් සිටී.මවා පෙන්වන තත්ත්වයට වඩා සත්‍ය තත්වය අතිශය බිහිසුණුවන අතර බලවත් ඛේදවාචකයක් ඇස්පනාපිට ඉස්මතු වෙමින් තිබේ.

ජන ජීවිතය දිනෙන් දින බරපතල අගාධයකට කඩා වැටෙමින් තිබෙන අතර,අති විශාල පිරිසකට රැකියා අහිමි වී ඇත. රැකියාවේ අභිමානය සහමුලින්ම තුරන් කොට ඔවුන්ට අපහාස උපහාස කරන මට්ටමට ආණ්ඩුව පත්ව ඇත.වසර ගණනාවක් තිස්සේ කිසිදු වැටුප් වැඩි වීමක් සිදුවී නැති අතර, දේශපාලනික පලිගැනීම් බලවත් පීඩාකාරී තත්ත්වයක් ලෙස වර්ධනය වී ඇත. ඛේදවාචකය වන්නේ රටේ 40%ක් පමණ අධ්‍යාපනය හා සෞඛ්‍ය සඳහා වූ වියදම් කපාහැර තිබීම ය. ජනගහණයෙන් 85%ක් මුදල් ණයට ගැනීම, අධ්‍යාපනය සහ සෞඛ්‍ය සඳහා වූ වියදම් අඩුකිරීම, ඉතුරුම් වියදම් කිරීම,ජනගහනයෙන් 68%ක් පමණ ආහාර ගන්නා ප්‍රමාණය අඩුකිරීම, ආහාර වේල් ගණන අඩුකිරීම, වැනි ඛේදවාචකයන්ට මුහුණ දී සිටී.ජගහණයෙන් 14.3%ක් දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත්වීම තුළ ආර්ථික අර්බුදයේ පීඩනය වඩාත් උග්‍රවිය හැකි බවට මහ බැංකුව පුරෝකථන ඉදිරිපත් කොට තිබේ.

අපේ රට කම්කරු දිනය සමරන්නේ එවන් තත්ත්වයක් තුළය!

සකලවිධ බලාපොරොත්තු අහිමිකොට,සිනහව වෙනුවට කඳුළද, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවට තර්ජනය සහ මර්දනයද, ආණ්ඩුව විසින් ජනතාවගේ කරමත පටවා ඇති තත්ත්වයක් තුළ කම්කරු දිනය සමරන අතර මේ තත්ත්වය සහමුලින්ම වෙනස් කොට මානව නිදහස, දේශයේ අභිවෘද්ධිය ස්ථාපිත කළ හැක්කේ ඒ සඳහා තිරසාර වැඩපිළිවෙළක් ඇති කණ්ඩායමකට පමණක් බව අද වන විට ඕනෑවටත් වඩා ඔප්පු වී තිබේ. අසාර්ථක ලුම්පන් ධනවාදයෙන් හෝ යල් පැනගිය සමාජවාදයෙන් රටක් ගොඩනැඟිය නොහැකි බව යථාර්ථය වන අතර එය කළ හැක්කේ සද් ජාතිකත්වය පදනම් කරගත් මැද මාවතේ ගමනකින් පමණි.

අන්තවාදයෙන් තොර, වර්ග වාදයෙන් තොර, ත්‍රස්තවාදයෙන් තොර ශ්‍රේෂ්ඨ රටක් ලෙස අපේ රට ගොඩනැගීමේ අභියෝගය භාරගත හැකි එකම බලවේගය සමගි ජන බලවේගය වන අතර එකී විශ්වාසනීය වැඩපිළිවෙළ සමඟ ශක්ති සම්පන්න කඳවුරක් ගොඩනැගීම උදෙසා එක් වන ලෙස දේශීය සමස්ත වැඩ කරන ජනතාවට ගෞරවයෙන් සහ අභිමානයෙන් ආරාධනා කර සිටිමු!

**සජිත් ප්‍රේමදාස,**
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක සහ
සමගි ජන බලවේගයේ නායක.

| | | | | | |
|---|---|---|---|---|---|
| දුරකතන: Telephone: தொலைபேசி | 011 2777253 / 011 2699171 | ෆැක්ස්: Fax: தொலைநகல்: | 011 2699174 | විද්‍යුත් තැපෑල: Email: மின்னஞ்சல்: | sajith_p@dialogsl.net |

අංක 30, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 7 I இலக்கம் 30, சர் மார்கஸ் பெர்னாண்டோ மாவத்தை கொழும்பு 7 I No 30, Sir Marcus Fernando Mawatha Colombo 7